සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය


**13 ශ්‍රේණිය** | **යුරෝපා ඉතිහාසය** | **පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 5 ) | 02. ( 5 ) | 03. ( 1 ) | 04. ( 3 ) | 05. ( 2 ) | 06. ( 2 ) | 07. ( 3 ) | 08. ( 2 ) | 09. ( 4 ) | 10. ( 3 ) |
| 11. ( 4 ) | 12. ( 3 ) | 13. ( 2 ) | 14. ( 4 ) | 15. ( 5 ) | 16. ( 3 ) | 17. ( 3 ) | 18. ( 2 ) | 19. ( 3 ) | 20. ( 5 ) |
| 21. ( 3 ) | 22. ( 5 ) | 23. ( 2 ) | 24. ( 4 ) | 25. ( 5 ) | 26. ( 1 ) | 27. ( 2 ) | 28. ( 3 ) | 29. ( 1 ) | 30. ( 4 ) |
| 31. ( 3 ) | 32. ( 3 ) | 33. ( 2 ) | 34. ( 1 ) | 35. ( 2 ) | 36. ( 1 ) | 37. ( 2 ) | 38. ( 4 ) | 39. ( 3 ) | 40. ( 3 ) |

## II කොටස

01.




නිවැරදිව ලකුණු කළ ස්ථානයන් දෙකක් පිළිබඳව කෙටි සටහනක් ලියා දැක්විය යුතුය.

**ලකුණු කිරීමට ලකුණු 1 බැගින් 8 ක්**
**කෙටි සටහනට 5 බැගින් ලකුණු 10 ක්.**

02. 1789 ජූලි 14 වන දා ප්‍රංශ විප්ලවය ඇති විය. 1789 ට පෙර පැවති පරිපාලන, සමාජ, ආර්ථික රටාව විප්ලවය කෙරෙහි බලපෑවේය. රාජ්‍යයේ අන්තනෝමතික පාලනය හා අකාර්යක්ෂමතාවය පරිපාලනමය අතින් හේතුවක් විය. 14 වන, 15 වන හා 16 වන ලුවී රජවරු තිදෙනාගේම ක්‍රියාකලාපයන් මෙම විප්ලවයට හේතු විය.
14 වන ලුවී රජු අනවශ්‍ය ලෙස විදේශ යුද්ධ වලට මුදල් වැය කිරීම වර්සායි වැනි අලංකාර මාලිගා තැනීමට අධික ලෙස මුදල් වියදම් කිරීම අදළ බලතල අඩු කළේය. හැන්ටිස් ආඥාව අවලංගු කිරීම 15 වන හා 16 වන ලුවී රජුන් කම්මැලි කාමාසක්ත ජීවිතයක් ගත කළ අකාර්යක්ෂම පුද්ගලයන් වූහ. 15 ලුවී 7 අවුරුදු යුද්ධයට සහ ඇමරිකානු නිදහස් සටනට මුදල් වැය කිරීම සමගින් ආර්ථිකය පිරිහීම නිසා ප්‍රංශ භාණ්ඩාගාරය බංකොලොත් භාවයට පත්විය. රටේ බහුතරය වූ සාමාන්‍ය ජනතාව කිසිදු අයිතිවාසිකම් නොමැතිව පීඩනයට පත්ව තිබීම, ප්‍රදේශයෙන් ප්‍රදේශයට නිති වෙනස් වීම,
ඒඩින් වෙළඳ ගිවිසුම නිසා ඇති වූ තත්වය,
මාරි ඇන්ටෝනියෝ බිසවගේ ක්‍රියා කලාපය.

03. (1) වියානා සම්මේලනය මගින් 1789 ට පෙර පැවති යුරෝපය සෑදීමෙන් අනතුරුව ඉතාලියට එය බලපෑවේය. ඉතාලිය කොටස් ගණනකට වෙන් කරන ලදී. ප්‍රදේශයෙන් ප්‍රදේශයට විවිධ ජාතීන් විසින් පාලනය කළ නිසා එකමුතු කමක් නොවීය. ජාතික හැඟීම් පහළ වීමට බාධාකාරී විය. ඉතාලිය මැදහත් රාජ්‍යයක් ද විය. එය ද බාධාවකි. පාලනය පිළිබඳව ද විවිධ මත දරූ පුද්ගලයන් විය. පාලක තන්ත්‍රය ද එක්සත්ව සිදු නොවිණි.

(2) කබොනාරි නම් ගල් අඟුරු පතල් කම්කරුවන්ගේ සංගමය මගින් ජාතික හැඟීම් ඉස්මතු කිරීමට කටයුතු සැලසීම.
මැසිනිගේ තරුණ ඉතාලිය නම් සංවිධානය මගින් කැරලි ඇති කිරීම.
පීඩ්මොන්ට් රාජ්‍යයේ මාවුර්ගේ දායකත්වය මගින් අවුස්ත්‍රියාවට විරුද්ධව සටන් වැදීමට උපක්‍රම යෙදීය. පසුව, ගැරිබෝල්ඩි පාප් රාජ්‍යය හැර ඉතිරි ප්‍රදේශ අල්ලාගෙන වික්ටර් ඉමානුවෙල්ට ප්‍රධානය කරයි. 1870 දී මැෂිනි, කාවූර් හා කැරිබෝල්ඩි ඉතාලිය එක්සත් කරයි.

04\. (1) ප්‍රධාන සාධකය 1453 කුරුස යුද්ධය.
පුනරුදය හේතුවෙන් ඇති වූ විද්‍යාත්මක දියුණුව හේතුවෙන් රුකුලක් විය. නාවික ශිල්පය දියුණු වීම, / ලෝකය ගෝලාකාර බව ඔප්පු වීම, ජාතික රාජ්‍යයන්ගේ රජවරුන්ගේ හා ධනවතුන්ගේ ආධාර හිමි වීම, ආගම ප්‍රචාරය කිරීම ද පෙළඹවූ සාධකයකි. ත්‍රාසජනක අත්දැකීම් ලබා ගැනීමට ඇති කැමැත්ත.

(2) පෘතුගාලයේ භූගෝලීය පිහිටීම ද දේශ ගවේශණයට හේතු විය. අත්ලාන්තික් සාගරයට මුහුණලා පිහිටා තිබීම.
නාවුක හෙන්රි රජුගේ දායකත්වය
දැඩි රෝමානු කතෝලිකයන් වූ නිසා ආගම ප්‍රචාරය කිරීමට පියවර ගත්හ. 1498 ඉන්දියාවේ කැලිකට් වරායට පැමිණි වස්කෝද ගාමා පැවසුවේ, කුළුබඩු හා ක්‍රිස්තියානින් සොයා පැමිණි බවයි.
ප්‍රෙස්ටර් ජෝන් නම් කතෝලික රජෙක් සිටින බවට වූ මතය.
1488 දී බර්තලමියු ඩයස් ශුභ පැතුම් තුඩුවට ලඟා විම.

05\. සිව්වන හෙන්රිගේ පාලන සමය
රිචලියුගේ පාලනය
14 වන ලුවී රජුගේ පාලනය මෙම අවධි තුන පිළිබඳව විශේෂ අවධානය යොමු කර කරුණු දැක්විය යුතුය.

06\. (1) කතෝලික පල්ලියට තිබූ අසීමිත බලයට එරෙහිව නැගී සිටීම.
කුරුස යුද්ධ හේතුවෙන් බුද්ධි ප්‍රබෝධයක් ඇති වීම
මුද්‍රණ යන්ත්‍රය මගින් බයිබලය ව්‍යාප්ත වීම
පූජකයන්ගේ දූෂිත ක්‍රියා කලාපය
ජර්මන් රාජ්‍ය වල කුමාරයින් ශුද්ධරෝම අධිරාජ්‍යයාගෙන් නිදහස් වීමට බලා සිටීම.
මාටින් ලූතර්ගේ ක්‍රියාමාර්ග

(2) එතෙක් යුරෝපයේ පැවති ආගමික එක්සත් බව බිඳී ගියේය. රෝමානු කතෝලික ආගමට විරුද්ධව විවේචන හා මතවාද බිහි විය. ආගමික නිකායන් බිහිවිය. (ලූතර් වාදය, කැල්වින් වාදය)
රෙපරමාදු ව්‍යාපාරය යුරෝපය පුරා සීඝ්‍ර ලෙස පැතිරීම.
ආගමික ගැටුම් ඇතිවීම හා තිස් අවුරුදු යුද්ධය
ක්‍රිස්තු සභාව සංශෝධනය කිරීම.
අධර්ම මර්ධනාධිකරණය ඇති කිරීම.
ට්‍රෙන්ට් සම්මේලන පැවැත්වීම.
1515 දී ඔග්ස්වර්ග් සමතය පැවැත්වීම.

07\. I වන ලෝකය ජයගත් ජාතීන් හා පරාජිත ජර්මනිය අතර ඇති වූ වර්සෙල්ස් ගිවිසුම II ලෝක යුද්ධයට තුඩු දුන් බලවත් හා ප්‍රධාන හේතුවක් විය.
ජර්මනියට දැඩි දඬුවම් හා වන්දි මුදල් පැණවීය.
වර්සායි ගිවිසුම ජර්මනිය මත බලහත් කාරයෙන් පැටවූ ගිවිසුමක් වේ.
ජර්මානුවන් අධික දුක්ඛිත තත්වයකට පත් ව සිටීම මගින් හිට්ලර් වැනි පාලකයෙක් බිහිවිය. ඔහුගේ ක්‍රියාකලාපය II ලෝක යුද්ධයට ආසන්නතම හේතුව විය.
ඉතාලියේ මුසලෝනිගේ පැසිස්ට් වාදය මත පදනම් වූ පාලනය.
ජාතීන්ගේ සංගමය අසාර්ථක වීම.
ජර්මනිය, ඉතාලිය මෙන්ම ජපානය ද ආක්‍රමණකාරී ලෙස අන් රටවලට තර්ජනය කිරීම.

08\. 1815 දී නැපෝලියන් බොනපාට් වෝටර්ලූ සටනින් අන්ත පරාජයකට පත් වීමත් සමඟ ඔහු අවුල් කළ යුරෝපය නැවත පෙර තිබූ තත්වයට ගෙන ඒමට 1815 දී අවුස්ත්‍රියාවේ වියානා නුවර සම්මේලනයක් පවත්වන ලදී. එහි නායකත්වය ගත්තේ මෙටර්නික් විසිනි. අනෙක් බලවතුන් ලෙස රුසියාව, ප්‍රශියාව හා එංගලන්තය සහභාගි විය. විශ්ව සාමූහික ආරක්ෂක ක්‍රමය පිළිබඳව මූලධර්ම හඳුන්වා දුනි. ප්‍රංශයේ දී පැරණි බූර්බෝන් රජ පරම්පරාව නැවත ස්ථාපනය කළේය. 18 වන ලුවී රජ කළේය.
වියානා සම්මේලනය මගින් වසර 40 ක් පමණ යුරේපයේ සාමය ආරක්ෂා කිරීමට කටයුතු කෙරිනි.
ජාතීන්ගේ සංගමයට හා එක්සත් ජාතීන්ගේ සංවිධානයට පූර්වාදර්ශයක් සැපයීය.

The National e-learning Portal for The General Education